# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2163/11 - 2020 පෙබරවාරි මස 17 වැනි සඳුදා - 2020.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු ආඥාපනත යටතේ නිවේදනයයි

**(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 03/2019)**

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2020 පෙබරවාරි මස 06 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ආර්. ආටිගල,
ලේකම්,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය.

2020 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

*යෝජනාව*

මෙම යෝජනාව ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ ''අ'' උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බව ද මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

1A - G 32063 — 52 (2020/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | තීරුබදු ප්‍රමාණය සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| **07.13** | | | **පිට කුරුට්ට ඉවත් කළ හෝ නොකළ පියලි කළ හෝ නොකළ හෝ පොතු ගැලවූ වියළි රනිල එළවළු.** | | | |
| | | --- | උඳු | | | |
| | 0713.31.21 | ---- | රසායනික පිළියම් කිරීම් මගින් වැපිරීම සඳහා සහතික කරන ලද හා ආහාරයට ගැනීමට නුසුදුසු බවට සලකන බෝංචි වර්ගයේ ඇට | | නිදහස් | කි.ග්‍රෑ. |
| | 0713.31.22 | ---- | පියළි කළ | | 15% | කි.ග්‍රෑ. |
| | 0713.31.29 | ---- | අනෙකුත් | | 15% | කි.ග්‍රෑ. |
| | | | | | | |
| **24.01** | | | **නිෂ්පාදනය නොකළ දුම්කොළ ; දුම්කොළ අපතයන්** | | | |
| | | | | | | |
| | 2401.10 | - | නාරටි නොකැපූ, නොඉරූ, දුම්කොළ | | 85% හෝ කි.ග්‍රෑමයට රු. 165/- | කි.ග්‍රෑ. |
| | 2401.20 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් නාරටි කැපූ/ඉරූ, දුම්කොළ | | 85% හෝ කි.ග්‍රෑමයට රු. 165/- | කි.ග්‍රෑ. |
| | 2401.30 | - | දුම්කොළ අපතයන් | | 85% හෝ කි.ග්‍රෑමයට රු. 165/- | කි.ග්‍රෑ. |

03 - 186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.